# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2004 පෙබරවාරි මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 පෙබරවාරි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 පෙබරවාරි මස 03 වන දින]

එල්.ඩී.—ඕ. 2/2004.

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1988 අංක 2 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) සෑම පළාත් සභාවක් ම, ජනාධිපතිවරයා විසින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක නිශ්චිතව සඳහන් කරනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින් සමන්විත වන්නේ ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "වර්ග කිලෝ මීටර් 1000 ට ගනන් ගත යුතු ය.", යන වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න :—

"වර්ග කිලෝ මීටර් 1000 ට ගනන් ගත යුතු ය :

එසේ වුව ද, මේ උපවගන්තිය ප්‍රකාර කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අනුරූපව, මේ පනතේ 61අ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තෝරා පත් කරගනු ලැබිය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා දෙදෙනකුගෙන් අඩු සංඛ්‍යාවක් විය යුතු ය.".

2—H 020422—4,500 (2004/02)

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය;" යන වචන වෙනුවට "සෙනසුරාදා දිනයකට යෙදෙන යම් දිනයක් වන්නා වූ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කොමසාරිස්වරයාගේ තීරණය පරිච්ඡින්න කිරීම.

**4.** 3 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලදුව, 2003 දෙසැම්බර් 16 වන දින අංක 1319/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද තීරණය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32. ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය. ලෝටස් පාර. කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.